කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව
දූරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය

ශාස්ත්‍රවේදී සාමාන්‍ය උපාධි ද්විතීය පරීක්ෂණය (බාහිර) 2012
මානව ශාස්ත්‍ර පීඨය

# සිංහල - SINH E2015
# සිංහල ගද්‍ය සාහිත්‍යය, නාට්‍ය හා සිනමාව

ප්‍රශ්න සංඛ්‍යාව 10 යි. කාලය පැය 3.00 යි.

එක් කොටසකින් ප්‍රශ්නයක් බැගින් වත් තෝරා ගෙන ප්‍රශ්න පහකට (05) පිළිතුරු සපයන්න.

නොපැහැදිලි අත් අකුරුවලට ලකුණු අඩු කරනු ලැබේ.

---

## 1 කොටස

1. පහත සඳහන් ඡේදය ලිහිල් බසින් ලියා කතුවරයාගේ අවස්ථා නිරූපණ කුසලතාව අගයන්න.

බැමිණි ඒ බස් අසා සැබව, සැමියන් අතින් මෙහෙ ගන්නා කුලයෙක මා උපන්නේ නැත. එම්බල, මම තට උපායක් කියමි, මහත් යශස් ඇති ගුණයෙන් සම්පන්න වූ වෙස්සන්තර නම් මහ රජාණෝ ඉච්ඡා දන් දෙති. උන්ගේ වස්තුව ගෙන යෑ අනාථයන් සුව විඳිනේ. දැන් ඒ උත්තමයා වංකගිරි පර්වතයෙහි තපස් කෙරෙයි. තෝ ඔබ ගොස් මට මෙහෙ කරන වහලක් ගෙනෙයි නම් හිඳිමි, නැත, මාගේ දෙමව්පියන්ගේ ගමට නැඟී ගොස් අනිත් මා සේ මැ ළදරු වූ, දැසි දසුන් විසින් සම්පන්න වූ පුරුෂයකු කෙරේ හිඳිමි. තා බල බලා සිටියැ දී ඌ හා මා කෙළනා කලැ මහල්ල, තා සිතට සුවයෙක් නැත්තේ වේ දැයි කිව. එ බස් අසන්නා මැ බමුණා ළය ඉපිළැ හිණ, ළ පිරුණු ශෝකයෙන් මහත් කොට මියුඩුහුරු ලා කියන්නේ, සොඳුර, මම ශක්ති නැත්තෙමි; වෘද්ධයෙමි; වංකගිරි පර්වතය ඉතා දුරැ යැ; නොයා හෙමි; ගෙහි කළ මනා මෙහෙ මම් මැ කෙරෙමි; තෙපි එයට අසමාධි නො වව යි කී යැ. එබස් අසා බැමිණි කියන්නී, තෝ සංග්‍රාම භූමියට නොවැද මැ පැරැදි එකකු වැන්නෙහි; ජඩ වූ තඹ විටි මැලිය, මට කන්නලව් නොපිරුවා ගොස් රජ්ජුරුවන් අතින් කෙල්ලක කොල්ලක ගෙනව යි කියා, බමුණා වෙර ලේ කයි; ඌ හින්ද සිටිය නො දී ඈත මැත ගැසෙමින් හවමින් වෙහෙසෙයි. බමුණු අඹුව කරන ගහටයෙන්, ඇ කෙරෙහි කළ හයින් යහපත, ගොස් වහල් ගෙනෙමි යි ගිවිසැ, වලින් දර ඇරගෙන ගේ පුරා ලා, දිය ඇරැ වළන් පුරා ලා, ගෙය සිසාරා වැට කොට, ඈට බත් බුලත් තබා ලා, ගමනට සැරැහී සිට, අඹුව තුන් විටෙක සිසාරා පැදකුණු කොට වැඳ, සතර තැනෙක බැස හෙව වැඳ, ඈ කෙරෙහි කළ හයින් හැකිළැ හැකිළැ සිප ගෙන, නිකට ගෙන සනහා ඈට කියන්නේ, සොඳුර මම ලස් නො වැ ම එමි. තෙපි බිය පත් වව යි සමු ගෙන, වහන් සඟලක් පය ලා කුඩමහල්ලක් අතින් ගෙන කෙන්ඩියෙන් පැන් හා මගට ගත් උපකරණ පය්‍ය කරට නගා ගෙනැ, අඹු ළඳරි කතුන් පෙරැළී සිට බල බලා වඩිමින්, වංකගිරි පර්වතයට යන මඟට ගොසින් මඟ දී සිතා පියා සිවි රට ගොස් වැද නොදිටි නම්, පසුව වංකගිරි පර්වතයට යෙමි යි කියා සිවි රට ගොස් වැද වෙස්සන්තරයෝ කොයි දැයි කියා විචාළේ. නගර වාසී ඒ අසා කිපී තව ද දන් ගැන්මෙහි නොනවතු ද? අපගේ ස්වාමීන් රටින් යන පරිද්දෙන් කළව, කුමට පිළිවිස්සී දැයි කිපී කැට පහණ ගෙන ලුහුබැඳ ගත්හ. බමුණු ද හෙමින් පිරිහෙමින් තොල් බොල් සිඳගෙන දණ උතු ලේ ලා ගෙනැ දිවන්නේ උතුරු දික් බලා මැ ගමන් ගත.

2. ආරම්භයේ සිට දඹදෙණි යුගය අවසානය දක්වා වූ චිරන්තන සිංහල ගද්‍ය සාහිත්‍යයේ ස්වරූපය පිළිබඳ විචාරාත්මක හැඳින්වීමක් කරන්න.

නැතහොත්

'බුත්සරණ නිර්මාණය කිරීමේ දී විද්‍යාචක්‍රවර්තීන්ගේ අභිප්‍රාය වූයේ බුදුන්වහන්සේ කෙරෙහි ශ්‍රාවකයාගේ ශ්‍රද්ධාව හා භක්තිය වර්ධනය කිරීම යි' මේ ප්‍රකාශයෙහි සත්‍යාසත්‍යතාව පරීක්ෂා කරන්න.

3. කථා ප්‍රවෘත්ති රසවත් ව ඉදිරිපත් කිරීමට ධර්මසේන හිමියන් දැක්වූ සාමර්ථ්‍යය **සද්ධර්මරත්නාවලිය** ආශ්‍රයෙන් විමසන්න.

## 2 කොටස

4. 'නූතන සිංහල කථා කලාවේ ප්‍රභවය ඇති වූයේ සම්භාව්‍ය සිංහල කථා කලාව ද පදනම් කරගනිමිනි' මේ ප්‍රකාශය ඔබ පිළිගන්නෙහි ද?

5. 'බැද්දේගම නවකථාව මගින් කාලීන සමාජ යථාර්ථය මැනවින් විග්‍රහ වේ' විමසන්න.

නැතහොත්

'ප්‍රේමය නම් අසෙනිය කුසුමක් වේ
රිසි වූ කෙනෙකුට පූජා කරන්ට
ලෝබ සිතින් තොර පිදුව මනා වේ
පෙරලා ලබන්ට නොසිතා බිඳකුත්'

'මේ ප්‍රකාශය මගින් **විලාසිනියකගේ ප්‍රේමය** නවකථාවේ සාමාගේ චරිතය කැටිකොට දක්වයි' පැහැදිලි කරන්න.

6. පහත සඳහන් කෙටිකතාවලින් එකක් පිළිබඳ ව විවේචනයක් කරන්න.

අ. තාප පටලය
ඉ. උරුම කරුමය
උ. නිවුණු තේ කෝප්පය

## 3 කොටස

7. 'ලක්දිව නාට්‍ය කලාවෙහි ප්‍රභවය පිළිබඳ සරච්චන්ද්‍ර විසින් ඉදිරිපත් කෙරෙන අර්ථකථනය යථාර්ථයෙන් බැහැර වේ' පක්ෂ ව හෝ විපක්ෂ ව කරුණු දක්වන්න.

8. 'සිංහල කවිනළු (නාඩගම්) සම්ප්‍රදාය කතෝලික මිෂනාරි ව්‍යාපාරයෙහි ප්‍රතිඵලයක් වශයෙන් ඇති වූයේ යැයි ප්‍රචලිත ව ඇති මතය සාවද්‍ය ය' මේ පිළිබඳ ඔබගේ අදහස් දක්වන්න.

නැතහොත්

කෝලම් රංගනය ගර්භ ශාන්තියක් ලෙස හැඳින්වීමෙහි යුක්ති යුක්ත භාවය පැහැදිලි කරන්න.

9. 'සුප්පා දේවිය දාරක ස්නේහය සහ පති භක්තිය අතර පීඩනයට පත් වන්නේ ස්වාභිමතය අනුව ගන්නා ලද තීරණයන්හි ප්‍රතිඵල වශයෙනි' සාකච්ඡා කරන්න.

නැතහොත්

ශෝක ජනිත නාට්‍යයක් ලෙසින් **ප්‍රොමිතියස් බන්ධනය** අගය කරන්න.

10. චිත්‍රපටය වඩාත් සමීප වන්නේ නාට්‍ය කලාවට නො ව නවකථාවට ය' විමසන්න.

නැතහොත්

සිනමාව වාර්තික කලාවක් වශයෙන් සලකන්නේ කවර හෙයින් දැයි නිදසුන් සහිත ව පැහැදිලි කරන්න.